# උතුරු මැද පළාතේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය

උතුරු මැද පළාත් සභාවේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ
නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු විධිමත් කිරීම සඳහාත්,
ඊට අදාළ කොන්දේසි විධිමත් කිරීම සඳහාත් ඒ හා සම්බන්ධ
හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම
සඳහාත් සකස් කරන ලද පටිපාටියකි.



Scanned with CamScanner

1. හැඳින්වීම.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022/12/14 දිනැති අංක 2310/29 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද කාර්ය පටිපාටික රීති 1 වෙනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ විධිවිධාන අනුව මෙම ස්ථාන මාරු පරිපාටිය "උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය" ලෙස හැඳින්වේ.

ස්ථාන මාරු පටිපාටියේ නාමය

1.1 උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I, II සහ III ශ්‍රේණියේ සියළු නිලධාරීන් මෙම ස්ථාන මාරු පටිපාටියට යටත් වන්නේය.

1.2 උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරනු ලබන දිනයේ සිට මෙම "උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය" ක්‍රියාත්මක වන්නේය. එම අනුමත කරන දිනට පෙර උතුරු මැද පළාතේ විදුහල්පති වාර්ෂික ස්ථාන මාරු සඳහා බලපැවැත්වූ සියලුම ප්‍රතිපත්ති හා පටිපාටි මෙදින සිට අවලංගු වේ.

ස්ථාන මාරු පටිපාටියේ ක්‍රියාත්මක දිනය

1.3 ස්ථාන මාරු කිරිමේ නියෝගයක් ලැබ සිටින නිලධාරියකුට නියමිත දින සිට ක්‍රියාත්මකවන පරිදි ඔහුගේ නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා කිරිමට හැකිවන පරිදි වර්තමාන සේවා ස්ථානයෙන් විධිමත් පරිදි නිදහස් කිරිම ආයතන ප්‍රධානියාගේ/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ අමාත්‍යාංශ ලේකම්ගේ වගකිමක් වන්නේය.

2. ස්ථාන මාරු පටිපාටියේ අරමුණු හා විධිවිධාන

2.1 අධ්‍යාපනය සෑම විටම ශිෂ්‍ය කේන්ද්‍රීය විය යුතු බැවින් විදුහල්පතිවරුන්ගේ ස්ථාන මාරු ලබාදීමේදී සේවා අවශ්‍යතා මුඛ්‍ය ස්ථානයෙහිලා සැලකිය යුතුය.

2.2 අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවය වර්ධනය කිරිමේ කාර්යය රඳා පවතින්නේ විදුහල්පතිවරුන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප මත බැවින් විදුහල්පති ස්ථාන මාරු ප්‍රතිපත්තිය තුළින් විදුහල්පතිවරුන්ට සිය දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කර ගැනිම සඳහා අවශ්‍ය අවකාශ සැලසිම.

2.3 විදුහල්පතිවරුන්ට වෘත්තීය සුරක්ෂිතභාවය පිළිබඳ විශ්වාසය තහවුරු වන ආකාරයට සහ ශාස්ත්‍රීය නිදහස ආරක්ෂාවන ආකාරයට සේවය කළ හැකි පරිද්දෙන් සහ වෘත්තීය තෘප්තිය උපරිම අයුරින් හිමිකර දීම.

2.4 අධ්‍යාපනය සම්බන්ධයෙන් පළාතේ දක්නට ලැබෙන විෂමතා හැකිතාක් දුරට අවම කරලීම මෙන්ම ශිෂ්‍ය මූලික ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය බාධාවකින් තොරව හා අඛණ්ඩව සිදුවීම.

2.5 කිසියම් ප්‍රදේශයකට හා පාසලකට සීමා වී ඇති මානව සම්පත් උතුරු මැද පළාතේ අනෙක් ප්‍රදේශයන්හි වෙසෙන ජනතාවටද ප්‍රයෝජනවත් වන ආකාරයට විදුහල්පති සේවයේ නියුතු මානව සම්පත් සාධාරණ පරිදි බෙදී යන අයුරින් ස්ථාන මාරු සිදු කිරිම.

2.6 එකම ප්‍රදේශයක හෝ විදුහලක අඛණ්ඩව සේවය කිරීමෙන් ඇතිවන ඒකාකාරී බව විදුහල්පති වෘත්තීය සංවර්ධනය කෙරෙහිද අහිතකර ලෙස බලපාන බැවින් විවිධ ප්‍රදේශ වල විවිධ සමාජ ආර්ථික හා සංස්කෘතික පරිසරවල ඇති විදුහල්වල සේවය සඳහා අවකාශ සැලසීමටත් නොයෙකුත් අත්දැකීම් ලබා ගනිමින් තම කාර්යක්ෂමතාවය වර්ධනය කර ගැනිමටත් සියලුම විදුහල්පතිවරුන්ට මෙමඟින් අවස්ථාව සැලසිම.



Scanned with CamScanner

2.7 ක්ෂේත්‍රයේ මානව සම්පත් විධිමත් කළමනාකරණය තුළින් උපරිම කාර්යක්ෂමතාවය කෙරෙහි යොමු කරලීම සඳහා අවකාශය සලසා දීම.

2.8 පළාත් තුළ සියලුම විදුහල්පති ස්ථාන මාරු මෙම පටිපාටිය අනුව විධිමත්ව හා විනිවිද බාවයකින් යුක්තව විදුහල්පති ස්ථාන මාරු මණ්ඩලය මඟින්ම ක්‍රියාත්මක කිරීම.

2.9 ජනප්‍රිය පහසු පාසල්වල දීර්ඝ කාලයක් සේවය කළ අත්දැකීම් බහුල විදුහල්පතිවරුන්ගේ සේවය අනෙකුත් පාසල් වලටද ලබාදීම හා දුෂ්කර පාසල්වල සේවය කරන විදුහල්පතිවරුන්හට පහසු හා වඩාත් පහසු පාසල්වල සේවය කිරීමට ඉඩ ප්‍රස්ථා ලබාදීම මඟින් විදුහල්පතිවරයාගේ වෘත්තීය තෘප්තිය ඉහළ නැංවීම.

3. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත්වන නිලධාරීන්

3.1 එක් සේවා ස්ථානයක අඛණ්ඩව වසර 05 සේවය සම්පූර්ණ කර ඇති උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I,II සහ III ශ්‍රේණියේ සියළු නිලධාරීන් මෙම ස්ථාන මාරු පටිපාටියට යටත් වන්නේය. එතකුදු වුවද දුෂ්කර/අතිදුෂ්කර පාසලක අවුරුදු 03ක් සම්පූර්ණ කරන විදුහල්පති නිලධාරියෙකුට වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීමට හැකියාව ඇත්තේය.

3.2 උතුරු මැද පළාත් සභාවෙන් පිටතට කරනු ලබන ස්ථාන මාරු ඉල්ලීම්ද වාර්ෂික ස්ථාන මාරු යටතේ සලකනු නොලැබුවත් එවැනි ඉල්ලීම් වෙතොත් වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් සලකා බලන අවස්ථාවේදී පළාතේ පවත්නා පුරප්පාඩු හා සේවා අවශ්‍යතාවය විශේෂයෙන් සලකා උතුරු මැද පළාත් විෂය භාර අමාත්‍යවරයාගේ සහ පළාත් ප්‍රධාන ලේකම්වරයාගේ එකඟතාවය විමසා පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය සහිතව ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීමට උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාට කටයුතු කළ හැකිය.

4. වාර්ෂික ස්ථාන මාරු කමිටු

4.1 වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ යෝජනා ලබා ගැනීම සඳහා උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විදුහල්පති ස්ථාන මාරු පිළිබඳ බලය අභිනියෝජිත බලධාරියා විසින් වාර්ෂික ස්ථාන මාරු කමිටු සෑම වසරකම ජූනි මස 01 දිනට පෙර පිහිටවිය යුතු වන්නේය.

*ස්ථාන මාරු සඳහා කාල සටහන ජූනි මස 01 ආරම්භ විය යුතු බව*

4.2 උතුරු මැද පළාත් විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු කමිටුවක සංයුතිය පහත පරිදි සඳහන් වන්නේය.

*වාර්ෂික ස්ථාන මාරු කමිටු සංයුතිය*

I. උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්/බලය අභිනියෝජිත නිලධරයා හෝ බලය අභිනියෝජිත නිලධරයා විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු

II. උතුරු මැද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන නිලධාරියෙකු

III. කලාප අටෙහි කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන නිලධාරියෙකු

*වාර්ෂික ස්ථාන මාරු කමිටු විෂය පථයට අදාළ නොවන කරුණු*

IV. දෙමළ මාධ්‍ය පාසල් නියෝජනය කිරීම සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දෙමළ මාධ්‍ය මාණ්ඩලික නිලධාරියෙකු



Scanned with CamScanner

V. ආයතන සංග්‍රහයේ iii පරිච්ඡේදයේ 3:5 (ආ) වගන්තියට අනුව වෘත්තීය සමිති ආඥා පනත යටතේ කම්කරු දෙපාර්තමේන්තුවේ අදාළ වර්ෂය හෝ පෙර වර්ෂයට ලියාපදිංචි වී ඇති වලංගු විදුහල්පති වෘත්තීය සමිතියකින් එක් දිස්ත්‍රික්කයකින් එක් නියෝජිතයෙකු බැගින් (සාමාජික)

4.3 පහත සඳහන් අවස්ථා වාර්ෂික ස්ථාන මාරු කමිටුවක විෂය පථයට ඇතුළත් නොවන්නේය.

I. විනය නියෝගයක් මත හෝ විනයානුකූල ක්‍රියාමාර්ගයක අවශ්‍යතාවය මත හෝ කරනු ලබන ස්ථාන මාරු

II. සේවා අවශ්‍යතාවය මත සිදු කරනු ලබන ස්ථාන මාරු

III. නිලධාරින්ගේ ඉල්ලීම මත කරනු ලබන වාර්ෂික නොවන ස්ථාන මාරු

5. වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය

5.1 උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් හෝ බලය අභිනියෝජිත බලධරයා විසින් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථාවේ බඳවා ගැනීම් පටිපාටිවල සඳහන් කොන්දේසි සැලකිල්ලට ගනිමින් වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය ක්‍රියාත්මක කල යුතුය. (ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසි සැලකිල්ලට ගැනීම)

5.2 වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් කරුණු සැලකිල්ලට භාජනය කළ යුතුය.

5.2.1.1 මෙම ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී සේවා අවශ්‍යතා වලට ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

5.2.1.2 වාර්ෂික ස්ථාන මාරු සඳහා කාලය ගණනය කරනු ලබන්නේ අයදුම්පත් කැඳවන වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනටය.

5.2.1.3 ස්ථානගත කිරීමේදී විදුහල්පතිවරුන්ගේ ජ්‍යෙෂ්ඨතාව පිළිබඳ අවධානය යොමු කළ යුතුය.

5.2.1.4 නිලධාරියාගේ ඉල්ලීම හෝ වෙනත් විශේෂිත කරුණු ඇත්නම් මිස සාමාන්‍ය වශයෙන් වයස අවුරුදු 57 ඉක්මවූ නිලධරයන් දැනට සේවයේ නියුතු දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතුය. නමුත් දිස්ත්‍රික්කය තුළ ස්ථාන මාරු කිරීම් වලට යටත් වන්නේය. (වාර්ෂික ස්ථාන මාරු කමිටුව විසින් සලකා බැලිය යුතු විශේෂිත කරුණු)

5.2.1.5 විදුහල්පති සේවයේ නිලධාරියකු වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබා ගනු පිණිස කිසියම් සේවා ස්ථානයක/ පාසලක සේවය කළ යුතු අවම කාලසීමාව වසර 05කි.

5.2.1.6 එසේ වුවද දුෂ්කර/අතිදුෂ්කර පාසලක අවුරුදු 03ක් සම්පූර්ණ කරන විදුහල්පති නිලධාරියෙකුට වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීමට හැකියාව ඇත.

5.2.1.7 ඉහත සඳහන් සුදුසුකම් සපුරාලන, විදුහල්පති සේවයේ ස්ථාන මාරු වලට යටත්වන නිලධාරීන් ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එසේ ස්ථාන මාරු අයදුම්කර නොකලේ වුවද, අදාළ කාල සීමාව ඉක්මවා ඇති නිලධාරීන් සේවා අවශ්‍යතාව සලකා උතුරු මැද පළාතේ ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට කැමති බවට සලකා ස්ථාන මාරු කමිටුවේ අභිමතය පරිදි ස්ථාන මාරුවීම් ලබා දිය යුතුය.



Scanned with CamScanner

5.2.1.8 ස්ථාන මාරුවීම් ලබා දීමේදී එකම සේවා ස්ථානයක වැඩිම සේවා කාලයක් සහිත නිලධාරියාගේ සිට සේවා කාලය අවරෝහණ පිළිවෙලින් ගණනය කර ඒ අනුව ස්ථාන මාරුවීම් ලබා දිය යුතුය.

5.2.1.9 වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීම සඳහා විදුහල්පති සේවයේ නිලධාරියෙකුට මනාපයන් 03ක් සහිතව අයදුම්පතක් ඉදිරිපත් කළ හැකි විය යුතු අතර, හැකි සෑම විටම එම මනාපයන් සඳහා වාර්ෂික ස්ථාන මාරු ලබා දීමට කටයුතු කළ යුතු වේ.

5.2.1.10 හැකි සෑම විටම පහත සඳහන් කරුණු කෙරෙහි පිළිගත හැකි කරුණු සහිතව අදාළ අයගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් කෙරෙහි අවධානය යොමු කිරීමට ස්ථාන මාරු කමිටුව කටයුතු කළ යුතුය. සලකා බැලිය යුතු වෙනත් විශේෂිත කරුණු

5.2.1.10.1 පාසල් යන දරුවන්, ආබාධිත දරුවන්, දීර්ඝකාලීන අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයා

5.2.1.10.2 කලත්‍රයා පොලිසියේ, ත්‍රිවිධ හමුදාවේ හෝ ක්‍රියාන්විත රාජකාරියේදී අබාධිත ව සිටීම

5.2.1.11 ඉහත 2හි සඳහන් කරුණු සියල්ල ඇතුළත් වන පරිදි පරිශිෂ්ට 01 මගින් හඳුන්වා දී ඇති ආකෘතියට අනුකූලවම වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කර ඇති බව

5.3 උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ නියුතු විදුහල්පති සේවයේ නිලධාරින් ජාතික පාසල් සඳහා නිදහස් වීමට(ස්ථාන මාරු) අයදුම් කරනු ලබන අවස්ථාවකදී පහත නිර්ණායක මත පදනම්ව වාර්ෂික ස්ථාන මාරු කමිටුව විසින් නිර්දේශ ලබා දෙනු ලැබේ.

I. උතුරු මැද පළාතේ පළාත් සභා පාසලක/ පාසල්වල විදුහල්පති සේවයේ වසර 10ක අවම සේවා කාලය සම්පූර්ණ කර තිබීම. (අනිවාර්ය වේ)

II. උතුරු මැද පළාත් සභා පාසලක විදුහල්පති සේවයේ නිලධාරියෙකු ලෙස දුෂ්කර සේවයේ වසර 03ක අවම සේවා කාලය සම්පූර්ණ කර තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

III. පූර්වාසන්න වසර 5ක සේවා කාලය තුළ විනය චෝදනාවක් සඳහා අවවාද කිරීමක් හැර විනය දඬුවම් නොලබා තිබීම.

IV. ස්ථාන මාරුව හෝ අනුයුක්තය ඉල්ලා සිටින අවස්ථාවේදී නිලධාරියාට එරෙහිව ක්‍රියාත්මකවන මූලික විමර්ශනයක් හෝ විනය පරීක්ෂණයක් නොමැති වීම.

V. පූර්වාසන්න වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් හදාරා තිබීම හෝ වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

VI. සේවා කාලය තුළ ලබා ඇති ඇගයීම් හා ජයග්‍රහණ

5.4 වාර්ෂික ස්ථාන මාරු කැඳවා ඇති අවස්ථාවකදී (සේවා අවශ්‍යතා/විනය හේතු/ සෞඛ්‍ය හේතු වැනි විශේෂ අවස්ථාවකදී හැර) විදුහල්පති සේවයේ නිලධාරින් ස්ථාන මාරු පටිපාටියෙන් පරිබාහිරව ස්ථාන මාරු, සුහද ස්ථාන මාරු හෝ අනුයුක්ත කිරීම් සිදු නොකළ යුතුය.

5.5 විදුහල්පති සේවයේ නිලධාරියෙකු විදුහල්පති ලෙස සේවය කරන්නේ නම් තම කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින්ද නියෝජ්‍ය විදුහල්පති ලෙස



Scanned with CamScanner

සේවය කරන්නේ නම් තම පාසලේ විදුහල්පති මගින්ද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති ආකෘතියට අදාළව නියමිත කාල සීමාව තුළ ස්ථාන මාරුවීම ඉල්ලුම් කළ යුතුය. එකම සේවා ස්ථානයක (විදුහල්පතිවරයෙකු ලෙස වැඩ ආවරණය කළ නියෝජ්‍ය විදුහල්පතිවරයෙකු/ සහකාර විදුහල්පතිවරයෙකු ලෙස) සමස්ථ වසර 5ක සේවා කාලයක් සහිතව ඉල්ලුම් කරන නොකරන විදුහල්පතිවරුන් පුරප්පාඩු පවතින වෙනත් පාසල් සඳහා ස්ථාන මාරු කිරීමට විදුහල්පති මාරු මණ්ඩලයේ නිර්දේශ මත පළාත් අධ්‍යාපන ලේකම්වරයාට බලය ඇත.

5.6 මාරු මණ්ඩලය විසින් වාර්ෂික ස්ථාන මාරු ලබා දීමට සුදුසු විදුහල්පති ශ්‍රේණිධාරීන් තේරීම සඳහා පහත සඳහන් කරුණු සලකා ලකුණු ක්‍රමයක් භාවිතා කරනු ලැබේ. එකම පාසලට අයදුම්කරුවන් කිහිපදෙනෙක් ඉල්ලුම්කර ඇති විටදී සහ එකම පාසලෙන් ශ්‍රේණිධාරීන් කිපදෙනෙක් ස්ථාන මාරු කිරීමට සිදු වී ඇති විටෙක ප්‍රමුඛතාවය ලබා දීමට මෙම ලකුණු ක්‍රමය භාවිතා කළ යුතුය. ලකුණු ක්‍රමය

උතුරු මැද පළාතේ සියලුම අධ්‍යාපන කලාප සමානව සලකනු ලබන අතර පාසල් වර්ගීකරණය අනුව ඒ ඒ පාසල්වල සේවා කාලයට පහත පරිදි ලකුණු ප්‍රදානය කරනු ලැබේ.

| පාසල් වර්ග | වසරකට හිමි ලකුණු |
|---|---|
| අතිදුෂ්කර පාසල් | 4 |
| දුෂ්කර පාසල් | 3 |
| පහසු පාසල් | 2 |
| වඩාත් පහසු පාසල් | 1 |

*කිසියම් පාසලකට අනුයුක්තව සේවය කර ඇත්නම් අනුයුක්ත පාසලට අදාළ ලකුණු හිමිවේ.

මීට අමතරව එක් වරක් පමණක් ගණනය වන පරිදි පහත නිර්ණායක සඳහා ලකුණු හිමි වේ.

- විවාහක නම් ලකුණු 02
- අවුරුදු 12ට අඩු දරුවන් සඳහා එක් දරුවෙකුට දකුණු 02 බැගින්
- විදුහල්පති තනතුරේ මුළු සේවා කාලය සඳහා වසරකට ලකුණු 01 බැගින්
- වෙනත් පළාත් වලින් පැමිණි විදුහල්පතිවරුන් සඳහා එම පළාතේ විදුහල්පති සේවා කාලය සඳහා වසරකට අමතරව එක් ලකුණ බැගින්

පළාත් තුළ වසර 10කට වැඩි සමස්ත සේවා කාලයක් සහිත විදුහල්පතිවරුන්ට ඉහත ලකුණු ක්‍රමයෙන් බැහැරව අන්තර් පළාත් ස්ථාන මාරුවීම් සඳහා සුදුසුකම් ලැබේ.



Scanned with CamScanner

5.7 වාර්ෂික ස්ථාන මාරු ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් ලබන නිලධාරින්ට විදුහල්පති සේවයේ නොවන නිලධාරින් දැනට වැඩබලන හෝ රාජකාරී ආවරණය කරනු ලබන පාසල් ඉල්ලුම් කිරීමටද හිමිකමක් ඇත.

5.8 ස්ථාන මාරු ඉල්ලීමේදී සහ අභියාචනා ඉදිරිපත් කිරීමේදී සලකා බලනු ලබන්නේ ඒ සඳහා සකස් කළ හඳුන්වා දෙනු ලබන ආදර්ශ ආකෘති පත් අනුවම සකස් කළ අයදුම්පත් පිළිබඳව පමණි.

5.9 සියලු විදුහල්පතිවරුන් සම්බන්ධයෙන් නිවැරදි හා සම්පූර්ණ විස්තර ලබාදීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සතු වගකීමක් වේ. සාවද්‍ය අසම්පූර්ණ විස්තර ඉදිරිපත් කර ඇති බව අනාවරණය වුවහොත් ඒ සම්බන්ධයෙන් අදාළ ආයතන ප්‍රධානීන් හා එම නාම ලේඛනය සකස් කළ හා පරීක්ෂා කළ නිලධාරින් වගකිව යුත්තන් වන්නේය. එපමණක් නොව ඔවුන් පිළිබඳව විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ

5.10 ස්ථාන මාරු කමිටු මඟින් ස්ථාන මාරුවීම් ලබාදී ඇති නිලධරයන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරී භාර ගැනීමට හැකිවන සේ ඔවුන් මුදා හැරීමට කටයුතු කළ යුතුය.

5.11 ආගමික හා සංස්කෘතික පසුබිමක් ඇති පාසල් වලට ස්ථාන මාරු ලබාදීමේදී සංස්කෘතික අගයන් සැලකිල්ලට ගනු ලැබේ.

5.12 වාර්ෂික ස්ථාන මාරු නියෝගයන් ලැබූ සියලුම නිලධරයන් නියමිත දිනයේදී නව රාජකාරී ස්ථානය වෙත සේවය සඳහා වාර්තා කිරීමට බැඳී සිටී.

6. පාසල් වර්ගීකරණය හා උපරිම හා අවම සේවා කාලය තීරණය කිරීම.

6.1 අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 01/2024(1) චක්‍රලේඛයේ සඳහන් පරිදි උතුරු මැද පළාතේ සියලුම පාසල් පහත සඳහන් පරිදි වර්ග කරනු ලබන අතර, වාර්ෂික ස්ථාන මාරු සඳහා එම වර්ගීකරණය සැලකිල්ලට ගනු ලැබේ. (ඇමුණුම 01) අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන නිර්ණායක මත පාසල් වර්ගීකරණය සංශෝධනය විය හැකි බැවින් ස්ථාන මාරු සලකා බලන වර්ෂයේදී බලපවත්නා පාසල් වර්ගීකරණය ස්ථාන මාරු ක්‍රියාවලියේදී යොදා ගත යුතුය. පාසල් වර්ගීකරණය

I. අති දුෂ්කර පාසල්
II. දුෂ්කර පාසල්
III. පහසු පාසල්
IV. වඩාත් පහසු පාසල්

6.2 ඉහත වර්ගීකරණය අනුව එක් එක් වර්ගයට අයත් පාසලක හෝ පාසල්වල සේවය කළ යුතු කාල සීමාවන් පහත අයුරින් විය යුතුය.

| පාසල් වර්ගය | සේවය කළ යුතු කාලය |
|---|---|
| අති දුෂ්කර හෝ දුෂ්කර පාසල් | අවුරුදු 03 අවම |
| පහසු පාසල් | අවුරුදු 05 උපරිම |
| වඩාත් පහසු පාසල් | අවුරුදු 05 උපරිම |

6.3 ඉහත සේවා කාලය ස්ථාන මාරු සලකා බලන වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට ගණනය විය යුතුය.



Scanned with CamScanner

7. වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර කැඳවීම

7.1 උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් හෝ බලය අභිනියෝජිත බලධරයා විසින් උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධරයන් වෙතින් වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම පිළිබඳ දැන්වීම සෑම වසරකම ජුනි මස 30 දිනට පෙර නිකුත් කළ යුතු වන්නේය. වාර්ෂික ස්ථාන මාරු සඳහා වන අයදුම්පත්‍ර ජුලි මස 31 දිනට හෝ එදිනට පෙර තමන් වෙත ඉදිරිපත් කළ යුතු බව ඔහු විසින් එම දැන්වීමෙහි සඳහන් කළ යුතු වන්නේය. වාර්ෂික ස්ථාන මාරු කාල රාමුව

7.2 උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් හෝ බලය අභිනියෝජිත බලධරයා වෙත ලැබෙන වාර්ෂික ස්ථාන මාරු සඳහා වන අයදුම්පත්‍ර අගෝස්තු මස 10 දිනට පෙර අදාළ වාර්ෂික ස්ථාන මාරු කමිටුවට භාරදීමට ක්‍රියා කළ යුතු වන්නේය.

7.3 වාර්ෂික ස්ථාන මාරු කමිටුවට අදාළ ස්ථාන මාරු පටිපාටියට අනුකූලව පරිශිෂ්ට 01 පරිදි ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් පමණක් සලකා බැලිය යුතු වන්නේය.

8. යෝජිත වාර්ෂික ස්ථාන මාරු නියෝග ප්‍රසිද්ධ කිරීම

8.1 ස්ථාන මාරු කමිටුව විසින් සිය යෝජනා ඉදිරිපත් කිරීමේදී මෙම වාර්ෂික ස්ථාන මාරු පටිපාටියේ සඳහන් විධිවිධානද ස්ථාන මාරු සම්බන්ධයෙන් වන රජයේ ප්‍රතිපත්තිද උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් හෝ බලය අභිනියෝජිත බලධරයා වෙත ලිඛිතව ඉදිරිපත් කිරීමට ක්‍රියා කළ යුතු වන්නේය. වාර්ෂික ස්ථාන මාරු කමිටු කාර්ය භාරය

8.2 සෑම වසරකම අගෝස්තු මස 15 වැනි දිනට පෙර, වාර්ෂික ස්ථාන මාරු කමිටුව විසින් තම ස්ථාන මාරු යෝජනා උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් හෝ බලය අභිනියෝජිත නිලධාරියා වෙත ලිඛිතව ඉදිරිපත් කිරීමට ක්‍රියා කළ යුතු වන්නේය. තමන් විසින් කරනු ලබන යෝජනාවලට පදනම වූ හේතු, පළාත් අධ්‍යාපන ලේකම්වරයා විසින් හඳුන්වා දී ඇති ආකෘතියකට අනුකූලව යථා පරිදි වාර්තා ගත කිරීම වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ වගකීම වන්නේය. (ජාතික පාසල් හා අන්තර් පළාත් ඇතුළත්ව)

8.3 සෑම වසරකම සැප්තැම්බර් මස 15 වැනි දිනට පෙර යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම අනුමත කර ප්‍රසිද්ධ කිරීමට උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් හෝ බලය අභිනියෝජිත බලධරයා විසින් ක්‍රියා කළ යුතු වන්නේය.

8.4 එම දැන්වීමේ සඳහන් වාර්ෂික ස්ථාන මාරු නියෝගයෙන් අතෘප්තියට පත්වන නිලධරයෙකු විසින් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් හෝ බලය අභිනියෝජිත බලධරයා වෙත කරුණු ඉදිරිපත් කළ යුතුය.(අභියාචනා) අවසාන දිනයද එම දැන්වීමෙහි සඳහන් කළ යුතු වන්නේය. එසේ වුවද එම කරුණු ඉදිරිපත් කිරීම සඳහා වන උපරිම කාලය නිවාඩු දිනයන්ද ඇතුළත්ව දින 14 කට වැඩි නොවිය යුත්තේය.

8.5 තමන්ට අදාළ යෝජිත වාර්ෂික ස්ථාන මාරු නියෝගය සම්බන්ධයෙන් කරුණු දැක්වීමට (අභියාචනා ඉදිරිපත් කිරීමට) අපේක්ෂා කරන නිලධාරියෙකු විසින් පරිශිෂ්ට 02හි සඳහන් ආකෘතියට අනුකූලව එම කරුණු



Scanned with CamScanner

දැක්වීම සිදු කළ යුතු වන්නේය. එහිදී විදුහල්පති සේවයේ නිලධාරියෙකු විදුහල්පති ලෙස සේවය කරන්නේ නම් තම කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මහින් හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මහින්ද නියෝජ්‍ය විදුහල්පති ලෙය සේවය කරන්නේ නම් තම පාසලේ විදුහල්පති මහින් හා කලාප/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මහින්ද තම කරුණු දැක්වීම (අභියාවනය) ඉහත කී දැන්වීමෙහි සඳහන් දිනට හෝ ඊට පෙර උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් හෝ බලය අභිනියෝජිත නිලධාරියා වෙත ලැබෙන පරිදි ඉදිරිපත් කළ යුතු වන්නේය.

8.6 අවශ්‍ය යැයි සිතන්නේ නම් එම කරුණු දැක්වීමෙන් පිටපතක් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් හෝ බලය අභිනියෝජිත නිලධාරියා වෙත සෘජුවම යොමු කිරීමටද අදාළ නිලධරියාට අවසර ඇත්තේය. අදාළ නිලධරයන් වෙතින් තමන් වෙත ලැබෙන කරුණු දැක්වීම වාර්ෂික ස්ථාන මාරු දැන්වීමෙහි සඳහන් නියමිත දිනට හෝ එදිනට පෙර උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් හෝ බලය අභිනියෝජිත නිලධාරියා වාර්ෂික ස්ථාන මාරු කමිටු කාර්ය භාරය වෙත යොමු කිරීම යථායෝග්‍ය පරිදි උතුරු මැද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ වගකීම වන්නේය

9. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු (අභියාවනා)

9.1 වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචනය (අභියාවනා) කිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවක් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් හෝ බලය අභිනියෝජිත නිලධාරියා විසින් සැප්තැම්බර් මස 15 දිනට පෙර පත් කළ යුතු වන්නේය.

වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව පත්කිරීම

9.2 අභියාවනා කමිටුව පහත සංයුතියෙන් යුක්ත විය යුතුය

I. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් හෝ බලය අභිනියෝජිත නිලධාරියා (සභාපති)

II. උතුරු මැද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

III. උතුරු මැද පළාත් අධ්‍යාපන ලේකම් විසින් නම් කරනු ලබන අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකු (එක් නිලධාරියෙකු වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල නියෝජනය කළ නිලධාරියෙකු නොවිය යුතුය)

IV. ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 3:5(ආ) වගන්තිය අනුව වෘත්තීය සමිති ආඥා පනත යටතේ ලියාපදිංචි කර ඇති වලංගු නියෝජිතයකු බැගින්

වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු සංයුතිය

9.3 වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව(අභියාවනා මණ්ඩලය) විසින් ඔක්තෝම්බර් මස 15 දිනට හෝ එදිනට පෙර හෝ යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් හෝ බලය අභිනියෝජිත නිලධාරියා වෙත ලැබීමට සැලැස්විය යුතු වන්නේය. එකී නිර්දේශ සඳහා හේතු උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් හෝ බලය අභිනියෝජිත නිලධාරියා විසින් හඳුන්වා දී ඇති ආකෘතියකට අනුකූලව යථා පරිදි එම වාර්තාවේ දැක්විමද වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ වගකීම වන්නේය.

වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු කාර්ය භාරය



Scanned with CamScanner

9.4 ඉහත 7.3 උපවගන්තියේ ප්‍රකාරව සිය නිර්දේශ ඉදිරිපත් කිරීමේදී අනුමත කරන ලද වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය හා රජයේ ප්‍රතිපත්තිද ඔවුන් විසින් සැලකිල්ලට ගත යුතු වන්නේය.

9.5 මෙම පටිපාටිය අනුකූලව ඉදිරිපත් කරනු ලබන කරුණු දැක්වීමක් ගැන වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් සලකා බලනු ලබන්නේ යෝජිත ස්ථාන මාරු කිරීම, ස්ථාන මාරු මණ්ඩලයේ ස්ථාන මාරු මණ්ඩලයේ ස්ථාන මාරු කිරීමේ පටිපාටියට පටහැනි බවට හෝ මුල් ස්ථාන මාරු නියෝගය වෙනස් කිරීමට තරම් සාධාරණ වන අයුරින් අදාළ තත්ත්වයන් වෙනස් වී ඇති බවට හෝ අදාළ ස්ථාන මාරු කිරීම නිසා විශේෂ ස්වභාවයකින් යුතු ඉතා බරපතල වූද පෞද්ගලික දුෂ්කරතා පැන නැගෙන බවට හෝ කරුණු ඉදිරිපත් කළ හොත් පමණි.

10. වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම

10.1 වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ යෝජනාද, වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ නිර්දේශද සැලකිල්ලට ගෙන වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීමට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ බලය අභිනියෝජන බලධරයා ක්‍රියා කළ යුතු වන්නේය.

10.2 සියලුම වාර්ෂික ස්ථාන මාරු කිරීම් ජනවාරි මස 01 දින සිට බලාත්මක කළ යුතුය. එදිනට අවම වශයෙන් මාස දෙකකට පෙරාතුව එනම් නොවැම්බර් මස 01 වැනි දිනට පෙර එකී නියෝග නිකුත් කිරීම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ බලය අභිනියෝජන බලධරයාගේ වගකීම වන්නේය.

11. වාර්ෂික ස්ථාන මාරු තීරණවලට එරෙහිව උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමා වෙත අභියාචනා ඉදිරිපත් කිරීමේ ක්‍රියා පටිපාටිය

11.1 වාර්ෂික ස්ථාන මාරු කිරීමක් පිළිබඳව උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් හෝ බලය අභිනියෝජන බලධරයා විසින් දෙන ලද නියෝගයකින් අතෘප්තියට පත්වූ කිසියම් නිලධාරියෙකු විසින් උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමා වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනයද මෙහි දැක්වෙන පරිශිෂ්ට 02 අනුව පමණක් සියලුම අදාළ තහවුරු කිරීම් ලියවිලිවල සහතික කළ පිටපත් ද සමඟ ඉදිරිපත් කළ යුතු වන්නේය.

11.2 නිලධාරියකු විසින් උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ යථා යෝග්‍ය පරිදි ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හා අමාත්‍යාංශ ලේකම්වරයා මඟින් පමණක් වන්නේය.

11.3 එසේ වුවද, එකී අභියාචනයේ ප්‍රගමන පිටපතක් උතුරු මැද පළාත් ආණ්ඩුකාර ලේකම් වරයා වෙත සෘජුවම යොමු කිරීමට එම නිලධාරියාට හැකියාව ඇත්තේය.

11.4 වාර්ෂික ස්ථාන මාරු කිරීම් නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් එම ස්ථාන මාරු කිරීමේ නියෝගය ප්‍රසිද්ධියට පත් කරන ලද දින සිට දින 14ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේය. නියමිත කාලය තුළදී ඉදිරිපත් නොවන අභියාචනා උතුරු මැද පළාත් ආණ්ඩුකාරතුමා විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.



Scanned with CamScanner

11.5 උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරවරයා වෙත යොමු කිරීම සඳහා නිලධරියෙකු විසින් භාර දෙනු ලබන අභියාචනයට අදාළ සියලු ලිපිගොනු, ලිපි ලේඛන හා වාර්තා ආදියද අභියාචනය පිළිබඳ ස්වකීය නිරීක්ෂණ හා මෙහි දැක්වෙන පරිශිෂ්ට 02 සමඟ නිර්දේශ සහිත එම අභියාචනය නොවැම්බර් මස 15 දිනට ප්‍රථම උතුරු මැද පළාත් ආණ්ඩුකාර ලේකම්වරයා වෙත ඉදිරිපත් කිරීමට අදාළ ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හා අමාත්‍යාංශ ලේකම්වරයා කටයුතු කළ යුතු වන්නේය.

11.6 එවැනි අභියාචනයක් ලැබී දින 15ක් ඇතුළත ඒ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරවරයා කටයුතු කරනු ලබන්නේය.

12. වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම

12.1 වාර්ෂික ස්ථාන මාරු නියෝගක් ලබා සිටින රජයේ නිලධරියකුට නියමිත දිනයේදී නව සේවා ස්ථානයෙහි රාජකාරි කටයුතු බාර ගැනීමට හැකිවන සේ වර්තමාන සේවා ස්ථානයෙන් ඔහු කල්වේලා ඇතිව නිදහස් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා හෝ ක්‍රියා කළ යුතු වන්නේය. එසේම නියම කර ඇති පරිදි නියමිත දිනට නව සේවා ස්ථානයේ රාජකාරි සඳහා වාර්තා කිරීම ස්ථාන මාරු නියෝග ලද නිලධාරියාගේද වගකීම වන්නේය.

12.2 වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලබා සිටින රජයේ නිලධාරියකුට නියමිත දිනයේදී නව සේවා ස්ථානයෙහි රාජකාරී කටයුතු බාර ගැනීමට හැකිවන සේ වර්තමාන සේවා ස්ථානයෙන් විධිමත් ලෙස මුදා හැරීමට කටයුතු නොකරන බලධරයන්ට එරෙහිව විනයානුකූල කටයුතු කිරීම අදාළ විනය බලධරයන්ගේ වගකීම වන්නේය.

12.3 වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලබා ඇති නිලධාරියකු තම ආයතනයෙන් මුදා හැරීම සඳහා ඔහුගේ අනුප්‍රාප්තිකයා පැමිණෙන තෙක් නොසිට ඔහුගේ රාජකාරී කටයුතු ආවරණය කිරීමට තාවකාලිකව වැඩපිළිවෙලක් අභ්‍යන්තර වශයෙන් යොදා ගැනීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා හෝ ක්‍රියා කළ යුතු වන්නේය.

12.4 තම කාර්යය මණ්ඩලයේ නිලධරියෙකු වෙත වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලද වහාම ඔහු භාරයේ ඇති රාජකාරී ලිපිගොනු, ලිපි ලේඛන, රජය සතු අනෙක් දේපල, යතුරු, පරිගණක මුරපද හා රාජකාරී හැඳුනුම්පත ආදිය එම ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව බාර ගැනීමට අවශ්‍ය විධිවිධාන යෙදීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා හෝ කටයුතු කළ යුතු වන්නේය. එසේම තමන් භාරයේ ඇති එවැනි සියලු දෑ යථා පරිදි භාරදීම සඳහා අවශ්‍ය විධිවිධාන තම ප්‍රධානියා සමඟ සාකච්ඡා කර සලසා ගැනීම වාර්ෂික ස්ථාන මාරු නියෝගය ලද නිලධාරියාගේ ද වගකීම වන්නේය.

12.5 වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් මත නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධාරියකු සිය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සලකා කටයුතු කිරීමට යථායෝග්‍ය පරිදි නව සේවා ස්ථානයට අයත් දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියාගේ හෝ වගකීම වන්නේය.



Scanned with CamScanner

12.6 නව සේවා ස්ථානයේ ප්‍රධානියාට ඉහත 12.5 උපවගන්තියේ සඳහන් කර ඇති පරිදි කටයුතු කිරීමට හැකිවනු පිණිස ස්ථාන මාරු නියෝග ලබා සිටින නිලධාරියා පිළිබඳ අවශ්‍ය තොරතුරු ඇතුළත් වන පරිදි පරිශිෂ්ට 03 දැක්වෙන ආකෘතිය අනුව වර්ථමාන සේවා ස්ථානයෙන් මුදා හැරීමේ ලිපිය නිකුත් කිරීමට අදාළ බලධාරියා විසින් කටයුතු කළ යුතුය. එම මුදාහැරීමේ ලිපියේ පිටපතක් නව සේවා ස්ථානයේ ප්‍රධානියා වෙත යොමු කළ යුතුය.

13. ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමෙන් පසු ගත යුතු පියවර

13.1 ස්ථාන මාරු ලබා දීමට සිටින නිලධරියකු ස්ථාන මාරුවී ගොස් දෙසතියක් ඇතුළත එම නිලධාරියා සම්බන්ධ පහත සඳහන් ලියවිලි නිලධාරියාගේ නව සේවා ස්ථානයේ ප්‍රධානියා වෙත විධිමත්ව යැවීම, යථායෝග්‍ය පරිදි ඔහුගේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ ආයතන ප්‍රධානියාගේ හෝ වගකීම වන්නේය.

- I. යාවත්කාලීන කරන ලද චර්යා සටහන සහ පෞද්ගලික ලිපි ගොණුව
- II. නිලධාරියාගේ අවසන් වැටුප් වර්ධකය ලබා දුන් දිනයේ සිට ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක වන දිනය දක්වා කාලච්ඡේදය සඳහා ඊළඟ වැටුප් වර්ධකය ලබාදීම පිළිබඳ තම ලිඛිත නිර්දේශය
- III. නිලධාරියාගේ කාර්ය සාධන ඇගයීම් වාර්තාව
- IV. නිලධාරියාගේ නිවාඩු විස්තර වාර්තාව හා නිලධාරියා විසින් ලබා ගත් නිවාඩු දුම්රිය බලපත්‍ර පිළිබඳ වාර්තාව
- V. නිලධාරියාගේ වැටුප් විස්තර වාර්තාව
- VI. නිලධාරියාගේ ණය ශේෂ වාර්තාව
- VII. තම ආයතනය තුළ සේවය කළ සමස්ථ කාල පරිච්ඡේදයට අදාළව නිලධරියාගේ වැටුපෙන් වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු ආයක මුදල් නොකඩවා අයකර ගනු ලැබ ඇති බව දැක්වෙන සහතිකය

අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය :-

උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

ලේකම්,
පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය
උතුරු මැද පළාත

කේ.එම්.එච්.එස්.කේ. ජයලත්
ලේකම්
ප්‍රධාන අමාත්‍යාංශය
උතුරු මැද පළාත

දිනය : 2026.07.15

(නිල මුද්‍රාව)

ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය :-

උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත.

ජේ.එම්.ආර්.පී. ජයසිංහ
ප්‍රධාන ලේකම්
ප්‍රධාන ලේකම් කාර්යාලය
උතුරු මැද පළාත
අනුරාධපුර.

දිනය : 2026.07.20

(නිල මුද්‍රාව)



Scanned with CamScanner

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :-

උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය 2021.07.21 දින රැස් වූ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදී.

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.

පී.එස්. විමලවීර
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු මැද පළාත

දිනය : 26/07/21

(නිල මුද්‍රාව)

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය:-
උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය අනුමත කරමි.

ගරු ආණ්ඩුකාරවර
උතුරු මැද පළාත.

වසන්ත ජිනදාස
වැල්වල්වම (එක්සත් රාජධානිය)
ආණ්ඩුකාරවර
උතුරු මැද පළාත
අනුරාධපුර

දිනය : 03/8

(නිල මුද්‍රාව)



Scanned with CamScanner